11

යහගුණාංග පිළිබඳ ඉස්ලාමීය දැක්ම

وَإِنَّكَ لَعَلَى خُلُقٍ عَظِيمٍ

" තව ද නියත වශයෙන් නුඹ අතිශ්‍රේෂ්ඨ වූ යහගුණයන්ගෙන් හෙබි ය. "
(68 අල්-කළම් :4)

යහගුණ යනු අප විසින් වරින් වර භාවිතයට ගන්නා වචනයකි. මිනිස් සමාජයේ විවිධ තරාතිරම්වලට අයත් අය මේ පිළිබඳ කතා කිරීම, ලිවීම, උපදෙස් දීම ආදිය දිනෙන් දින අපගේ අවධානයට ලක් වෙයි. යහ ගුණාංග යන්න සමාජයෙන් බැහැර කළ නොහැකි අංගයකි, යන්නට මෙය කදිම නිදසුනකි.

යහ ගුණාංග යන්න අප "චරිතය" යනුවෙන් ද හඳුන්වමු. "චරිත" යන නාම ප්‍රකෘතියේ ගුණ නාමය චරිතය වේ. චරිතවත් ව හැසිරිය යුතු ය, චරිතය රැක ගත යුතු ය, යනුවෙන් මෙය විවරණය කළ හැකි ය. චරිතය යහ ගුණ යනාදී සිංහල වචනවලට සමාන අර්ථ දෙන වචන ලෙස ට අරාබි භාෂාවෙන් ආදබ්, අඛ්ලාක්, සුලූක් යන වචන භාවිත කෙරේ.

යහ ගුණාංගවල වැදගත්කම

ඉස්ලාමයේ අකායිද්, ඉබාදත්, මුආමලාත්, මුනාකහාත්, ජිනායාත්, අඛ්ලාක් යන විවිධ ප්‍රධාන කොටස් තිබුණ ද, අඛ්ලාක් හා සම්බන්ධ කොටස අනෙක් සියලු කොටස් හා එක් ව මිශ්‍ර වන අන් සියල්ලෙහි අවසාන සියුම් අදහස ලෙස දැක්විය හැකි ය.

යහගුණයෙන් ඉස්ලාම් අලංකාර ක්‍රියාවන් (අහ්සනුල් හුලුක්) යන අර්ථයෙන් භාවිතයට ගනියි. එපමණක් නොව මෙම අලංකාර ක්‍රියාවන්ට ආදර්ශයක් ලෙස නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණන් සිටි බැවින්, එතුමාණන් ව අප සියලු දෙනා ආදර්ශයක් කොට ගත යුතු ය, යනුවෙන් අල්ලාහ් අල් කුර්ආනයේ පවසයි.

"තව ද නියත වශයෙන් නුඹ අතිශ්‍රේෂ්ඨ වූ යහගුණයන්ගෙන් හෙබි ය." (68 අල් කළම් ፡ 4)

"නිශ්චය වශයෙන් ම නුඹලාට අල්ලාහ්ගේ රසූල්වරයාගේ ආදර්ශ තිබුණි" (33 අල් අහ්සාබ් ፡21)

මෙලෙස ම යහගුණාංගවල අවශ්‍යතාව පිළිබඳ නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා සඳහන් කර ඇත.

"යහගුණාංග සම්පූර්ණ කිරීම සඳහා ම මා නබිවරයෙකු ලෙස පහළ කරනු ලැබ ඇත." (මුවත්තා)

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පිළිබඳ අයිෂා රළියල්ලාහු අන්හා තුමියගෙන් විමසන විට "නබි තුමාණන්ගේ ශීලාචාර බව අල් කුර්ආනය ලෙස ම පැවතුණි" (මුස්ලිම්) යයි පැවසුවා ය.

ඉස්ලාමීය දැක්මට අනුව යහගුණ ඇති ව හැසිරීම උසස් ඉබාදතයකි. මෙය පහත හදීසයෙන් පැහැදිලි වේ.

"කියාමා දිනයේ එක් මුඃමින් වරයකුගේ තරාදියේ යහගුණාංගවලට වඩා බරින් වැඩි යමක් නොතිබෙනු ඇත. අල්ලාහ් රළු ලෙස හා අසභ්‍ය ලෙස කතා කරන පුද්ගලයා අප්‍රිය කරයි. යමෙක් යහගුණාංග තුළින් සලාතය, සව්මය වැනි ඉබාදත් ඉටු කරන අයවළුන්ගේ උසස් භාවය ලබා ගනී. එසේ නොමැති ව දුර්ගුණාංගවලින් යුතු අය නිරයේ වේදනා විඳීවි යන්නත් නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණන් පවසා ඇත." (අහ්මද්)

" ඔහු තම නරක ගුණාංග නිසා නිරයේ ඉතා පහත් තත්ත්වය හිමි කර ගනියි." (තබරානි)

ඉස්ලාමයේ යහ ගුණාංග ඊමානයේ එක් අංගයක් ලෙස අදහස් කරයි. "කෙනකු තුළ යහ ගුණාංග වර්ධනය වන පමණට ඔහු පරිපූර්ණත්වයට පත් වේ." මෙම අදහස පහත හදීසයෙන් පැහැදිලි වේ.

"නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණන්ගෙන් ඊමානයේ පරිපූර්ණත්වට පත් මිනිසා කවුද, යැයි විමසන ලදි. එයට නබි සල්ලල්ලාහු අලෛහි වස්ලලම් තුමාණන් ''ඔවුන් අතරින් යහ ගුණාංග අධික ව ඇති තැනැත්තා" යයි පිළිතුරු දුන්හ. (තබරානි)

"අල්ලාහ්ගේ ගැත්තන්ගෙන් අල්ලාහ්ට ඉතා සමීප වන්නේ කවුරුන් දැයි නබි තුමාණන්ගෙන් විමසනු ලබන විට, උසස් චරිතයට හිමිකරුවා යැයි එතුමාණෝ පිළිතුරු දුන්හ." (ඉබ්නු හිබ්බාන්)

තවත් අවස්ථාවක දී "මිනිසාට දෙනු ලැබූ ඉතා උසස් වස්තුව කුමක් ද"යි විමසනු ලබන විට, නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණන් "උසස් චරිතවත් ගුණාංග" යැයි පිළිතුරු දුන්හ. (තිර්මිදි)

මෙම හදීසය මගින් යහගුණාංගවල ලක්ෂණ ගෙන හැර දැක්වීම ප්‍රමාණවත් ය.

යහ ගුණාංගවල අවශ්‍යතාව

චරිතය, චරිත මාලාව, චරිතවත් ප්‍රතිපත්ති, චරිත අධ්‍යයනය ආදී සියලු අංග මිනිස් සමාජයට අවශ්‍ය වනවා මිසක් අන් මැවීම්වලට අවශ්‍ය වන්නක් නොවේ. මන්දයත් මිනිසාට ක්‍රියා නිදහස ඇත. බුද්ධිය හා හැඟීම තිබීම ය; එබැවින් අනෙකුත් මැවීම්වලට වඩා අධික වරම් ලැබ මෙවැනි දීමනා හිමි වූ මිනිසා, එය වැරදි ක්‍රමවලට භාවිත නොකර සිටීමට යහ චරිත යන සත් ගුණය අල්ලාහ් අනිවාර්ය කර ඇත.

මිනිසා අනෙකුත් ජීවීන් මෙන් නොව අල්ලාහ්ගේ මැවීම් සඳහා ද කලීෆා ලෙස (නියෝජිතයා) මවා ඇති බැවින් අල්ලාහ්ගේ නියෝජිතයා යන වගකීම ඉෂ්ට කිරීමට ද, විශ්ව පරිපාලනය ක්‍රමවත් ව මෙහෙයවීමට ද ඔහුට සත් චරිතය අත්‍යවශ්‍ය ය.

මිනිස් ස්වභාවය තුළ අල්ලාහ් චරිතවත් හැඟීම ජනිත කර ඇත. මෙම හැඟීම ඔහුගේ යටි සිතේ නිතර ගැවසේ. අයහපත් පරිසරය මගින් හෝ අයහපත් මිතුරන් මගින් කෙනකු චරිතය කෙලෙස ගත් කෙනකු ලෙස පත් වුව ද, ඔහුගේ අභ්‍යන්තර හැඟීම ඔහුට අවවාද කරමින් පවතී. මෙම අවවාදය ඔහු නොසලකා හැරියේ නම් ඔහු දුෂ්චරිතවත් කෙනකු බවට පත් වේ. නොඑසේනම් එය උපදෙසක් ලෙස පිළිගත්තේ නම් උසස් චරිතවත් කෙනකු ලෙසට පත් වේ. මෙම උසස් තත්ත්වය ලබා ගැනීමට චරිතය පිළිබඳ දැනුම ද, පැහැදීම ද, හැඟීම ද, සිතුවිලි ද අවශ්‍ය ය.

එහෙත් මෙම අවශ්‍යතා මිනිසාට ඉබේ ම ඇති නොවේ. එබැවින් මිනිසා බෙලහීන වූවෙකි. එසේ ම බල හීන වූ ඔහුගේ බුද්ධිය ද, හැඟීම් ද බෙලහීන වේ. මෙම තත්ත්වය මත බෙලහීන වූ මිනිසාට යහ මාර්ගය පෙන්විය හැකි වන්නේ බෙලහීන නොවූ කෙනකුට ය.

මෙම බෙලහීන නොවූ උසස් තත්ත්වය ලබා දීමේ හිමිකම ඇත්තේ දෙවියන්ට පමණි. එබැවින් මිනිසාට හිමි සුචරිත සාර ධර්ම බෙදා දීමේ වගකීම ඉස්ලාම් අල්ලාහ්ට ම ලබා දී ඇත. මෙලෙස අල්ලාහ් තආලා ද තම දේව ධර්ම දූත මුහම්මද් සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණන් ද සීමා කොට දක්වන ලද ගුණාංග පමණක් අප යහ ගුණාංග ලෙස පිළිගත යුතු ය.

ඉස්ලාම් පවසන සමහර යහ ගුණාංග

ඉවසීම

ඉවසීම මිනිස් ජීවිතයේ වැදගත් ගුණාංගයකි. සෑම මුස්ලිම්වරයකුගේ ම දෙලොව ජීවිතයේ ජයග්‍රහණයට එය පාදක වේ. අල් කුර්ආන් හා සුන්නාහ් වේ. මෙම අලංකාරවත් ගුණාංගය අධික ව අවධාරණය කෙරේ.

අරාබි භාෂාවෙන් "සබ්ර්" යනුවෙන් හඳුන්වන මෙම වචනය අල් කුර්ආනයේ හැත්තෑවකට අධික ස්ථානවල පවසා තිබීම තුළින් මෙහි වැදගත්කම මනාවට පැහැදිලි වේ.

" තව ද ඉවසීමෙන් හා සලාතය (ඉටු කිරීම) මගින් පිහිට පතනු..." (2 අල් බකරා :45)

"තව ද බියෙන් හා සාගින්නෙන් ද වස්තූන්, ජීවිත හා භෝග (වල) පරිහානියෙන් ද අපි නුඹලාට පරීක්ෂා කරන්නෙමු. (මෙම පරීක්ෂණයන්හිදී නොසැළෙන) ඉවසිලිවන්තයින්ට (මුහම්මද්) නුඹ ශුභ ආරංචිය දන්වා සිටිනු." (2 අල් බකරා :155 බුහාරි)

ඉවසීම පිළිබඳ නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණන්ගේ රුවන් වැකි මගින් එහි අවශ්‍යතාව හා වැදගත්කම ගෙන හැර දක්වයි.

"ඉවසීම පිළිවෙතක් කර ගන්නා තැනැත්තාට අල්ලාහ් ඉවසීම ලබා දෙයි. තව ද ඉවසීම හිමි කර ගත් තැනැත්තාට වඩා උසස් සත් මාර්ගය හිමි කර ගත් වෙන තැනැත්තකු නොමැත." (බුහාරි)

"අල්ලාහ් තමා යහපත් දේ ලබා දීමට කැමතිවන්නන්හට ඔවුන්ගේ ඉවසීම පරීක්ෂා කිරීම සඳහා පරීක්ෂාවට ලක් කරයි" (බුහාරි)

ජීවිතයේ ඇති වන අපහසුතා වෙනුවෙන් සටන් කරන මිනිසා එය ජය ගන්නා සේ ම පරාජයට ද පත් වේ. මෙම අවස්ථා දෙකෙහි දී ම බාධාවකින් තොර ව ජීවිතය ගෙන යන්නා දෙවියන්ගේ ගෞරවයට පාත්‍ර වේ. පරලොවෙහි ද අන් සියල්ලන්ට වඩා කුසල් හිමි කර ගන්නේ ඔහු ය. මොවුන්ගේ උසස් තත්වය දන්නේ නම් ජීවිතයේ ඇති වන කලබලකාරී අවස්ථාවල දී එයින් මිදී ජීවත් වීමට ප්‍රිය කරයි. මේ පිළිබඳ පහත නබි වදනින් මෙසේ පවසයි.

"මෙලොව සැප සම්පත් ලබමින් දුෂ්කරතාවලින් තොර ව ජීවත් වූවන්, පරලොව ජීවිතයේ පරීක්ෂණවලට මුහුණ දී, ජය ලබා හිමි කර ගන්නා ගෞරවය දැක අප ද පරීක්ෂාවට ලක් වන්නට තිබුණා, එහි දී ඉවසීම ප්‍රගුණ කළා නම් අපට ද මෙවන් ප්‍රතිඵල ලැබෙන්නට තිබුණානේ, යැයි හූල්ලති." (තිර්මිදි)

එබැවින් අපි ද අප ජීවිතයේ ඉවසීම ප්‍රගුණ කර පරලොව දී දෙවියන් ලබා දීමට නියමිත උසස් තත්ත්වයන් හිමි කර ගනිමු.

වීරත්වය / ධෛර්යය.

ඉස්ලාම් පවසන යහගුණ අතරින් ධෛර්ය ද එකකි. ඉස්ලාමයට අනුව බියගුලු පුද්ගලයින් කිසිදිනක බිහි වීම ප්‍රිය නොකරයි. ශාරීරික ශක්තිය ද, මානසික ශක්තිය ද ලබන මිනිසුන් ඉස්ලාම් ප්‍රිය කරයි. ඒ වෙනුවෙන් අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කිරීමට ද මග පෙන්වයි.

"දෙවියනේ! දුක්, දෙම්නස්වලින් මිදීමට ඔබගෙන් ආරක්ෂාව පතමි. නොහැකියාව, අලස බව, බියගුලු බව, ලෝභකම, වැනි දේවලින් ද මිදීමට ඔබගෙන් ආරක්ෂාව පතමි. ණයගැති බාවය හා මිනිස් බලපෑම්වලින් ද මිදීමට ආරක්ෂාව පතමි." (බුහාරි)

"ශක්තිමත් මුඃමින්වරයකු දුර්වල මුඃමින්වරයකුට වඩා ශ්‍රේෂ්ඨ මෙන් ම අල්ලාහ් වඩාත් කැමැති පුද්ගලයකු ද වෙයි." (මුස්ලිම්) යනුවෙන් නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා පවසා ඇත. තම ප්‍රාර්ථනාවලට හා තම මුවින් පිට වූ වචනවලට අරුතක් දෙමින් එතුමාණෝ ධෛර්යසම්පන්න මහා වීරයකු ලෙස ජීවත් වූහ.

ශරීරය ශක්තිමත් කරන ශාරීරික ව්‍යායාමවල එතුමාණෝ නිරත වූහ. රුකානා නම් වූ මදීනාවේ විසූ මල්ලව පොර ක්‍රීඩකයකු සමග කීප විටක් ම තරඟ කර එතුමාණෝ ජය ගත්හ. එමෙන් ම තම බිරිඳ ආයිෂා රළියල්ලාහු අන්හා තුමිය සමඟ ධාවන තරග වල නිරත වූහ. මෙලෙස ධෛර්ය, වීරිය වඩන ක්‍රියාකාරකම්වල නිරත වීමෙහි ලා නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ ආදර්ශවත් ව සිටියහ.

කෙනකුට මෙම ධෛර්ය හිමි කර දෙන උල්පත ලෙස "ඊමාන්" පවතියි. සිතෙහි විශ්වාසය නිවැරදි ව හා ස්ථාවර ව පවතින තැනැත්තා තමා අත්කර ගැනීමට ප්‍රිය කරන ක්‍රියා කිරීමට හැකි වන ශක්තිය හා බලය ලබා ගනියි. මෙමගින් ඔහු දුෂ්කරතා හා විරෝධතා විඳදරා ගන්නා ඉවසීම හා බලය ලබා ගනියි.

"මේ මුළු ලෝකය ම එක් වී යහපත් දෙයක් කරන්නට උත්සාහ දරුව ද ඔබට අල්ලාහ් නියම කොට ඇති දේ හැරෙන්නට ඊට වඩා කිසි ම යහපතක් කරන්නට නොහැක. එමෙන් ම මේ මුළු ලොව ම එක් වී ඔබට අයහපතක් කරන්නට උත්සාහ දැරුව ද අල්ලාහ් නියම කර ඇති දේ හැරෙන්න වෙනත් කිසි ම අයහපතක් කරන්නට නොහැක." (තිර්මිදි)

කෙනකු තුළ දක්නට ලැබෙන වීර හැඟීම ඔහුට තමා අත් කර ගත් අරමුණ කරා වේගයෙන් ඇදී යාමට දිරි ගන්වනවා පමණක් නොව ඒ තුළ රැඳී සිටීමට ඇල්මක් ද, ගෞරවාන්විත ව ලබා දෙයි. ඉලක්කය ළඟා කර ගැනීමේ දී මුහුණ දීමට සිදු වන අභියෝගවලට ධෛර්යසම්පන්න ලෙස මුහුණ දීමට පුහුණුව ලබා දෙයි.

කීකරු බව

ඉස්ලාම් පවසන තවත් යහගුණයකි. කීකරු බව අහංකාරය, උඩඟු බව, ඉදිමුණු ගතිය ආදී අයහපත් ගුණාංගයන්ගෙන් මිදී සත්පුරුෂයින් සමග කීකරු ව කටයුතු කළ යුතු ය. කීකරු බව යන යහගුණාංගය පවත්වාගෙන යන පුද්ගලයා අල්ලාහ් ඉදිරියේ උසස් වූ හා ශ්‍රේෂ්ඨ වූ තත්ත්වයක් ළඟා කර ගනී.

අනවශ්‍ය අහංකාරය ඇත්තන්හට පරලොවහී දී ලැබීමට නියමිත නින්දසහගත වේදනා පිළිබඳ පවසන අල් කුර්ආනය හා අල් හදීසය එයට තර්ජනය කරන්නා සේ කීකරුව හැසිරීම තහවුරු කර, එමගින් මෙලොව හා පරලොව ලැබීමට නියමිත ප්‍රයෝජනය පිළිබඳ තදින් තහවුරු කරයි.

" අර්-රහ්මාන් (පරම දයාන්විතයා)ගේ ගැත්තන් කවරකුනම්, මහපොළොව මත නිහතමානීව ගමන් කරන අය වෙති. තව ද අඥාන ජනයා (උඩඟුවෙන්) ඔවුනට අමතන කල්හි සාමයැයි පවසන අය ද වෙති."(25 අල් ෆුර්කාන් :63)

කීකරු වීම යන යහගුණය ඇත්තා අල්ලාහ්ගේ විධානය පිළිගෙන බැගෑපත් වන මොහොතේ ඔහු අල්ලාහ්ගෙන් උසස් හා උත්තරීතර බව හිමි කර ගනියි.

"කවරකු අල්ලාහ් වෙනුවෙන් කීකරු ව හැසිරෙන්නේ ද ඔහුගේ තත්ත්වය අල්ලාහ් උසස් කොට තබයි." (මුස්ලිම්)

"කීකරු ව සිටින්න! ඔබෙන් කෙනකු අනෙකා වෙත අහංකාර නොවන්න; අපරාධයක් නොකරන්න; යයි අල්ලාහ් මට වහී මගින් දැන්වූයේ ය." (මුස්ලිම්)

නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණන්ගේ ජීවන ක්‍රමය බැගෑපත් බව, තැම්පත් බව, සිනිඳු බව ආදියෙන් විහිදී ගිය ආකල්ප සපිරි අලංකාර ආදර්ශයක් පෙන්නුම් කරයි. මග දෙපස කෙළිදෙළෙන් පසු වන කුඩා දරුවන්ට පවා සිනහමුසු මුහුණින් සලාම් පැවසීමට එතුමාගේ නබි පදවිය එතුමාණන්ට බාධා වූයේ නැත.

අනස් රළියල්ලාහු අන්හු තුමාණන් කුඩා දරුවන් පසුකර යන්නේ නම් ඔවුන්ට සලාම් පැවසුවේ ය. එසේ ම, 'නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණන් ද මෙලෙස ම කළේ ය' යැයි පැවසුවේ ය. (බුහාරි, මුස්ලිම්)

ඉස්ලාමීය නීති මාලාව දැන ගැනීම සඳහා වරක් තම්මි ඉබ්නු උසෙයිද් රළියල්ලාහු අන්හු මදීනාවට පැමිණියේ ය. එම ආගන්තුකයා ඉස්ලාමීය අධිරාජ්‍යයේ ප්‍රධානියා වන නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා හා තමා අතර බාධා කරවන කිසිවකු නොමැති වීම නිසා නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණන් මිම්බරයේ සිට ජනතාවට උපදේශ දෙමින් සිටි අවස්ථාවේ පැණයක් විමසීමට කැමති විය. එවිට නබි සල්ලල්ලාහු

අලෛහිවසල්ලම් තුමාණෝ කීකරු ව ඔහු දෙසට නැඹුරු වී ඔහුගේ ප්‍රශ්නවලට පිළිතුරු දුන්හ. ඒ පිළිබඳ තම්මි පවසන්නේ මෙසේ ය. 'නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම්තුමාණන් දේශනයක් කරමින් සිටින මොහොතක මම ඔහු වෙත ගියෙමි' අල්ලාහ්ගේ දූතයාණෙනි, ආගම යනු (තමා) වෙමි යයි පැවසුවෙමි. නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා වහා ම මා දෙසට හැරුණේ ය. පුටුවක් ද ගෙන එන ලදි. එහි අසුන්ගත්තේ ය. අල්ලාහ් ඔහු දැනුවත් කළ දේ ඔහු මා හට දැනුවත් කළේ ය. පසුව දේශනය නැවත අරඹා එය සම්පූර්ණ කළේ ය. (සහීහ් මුස්ලිම්)

නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණන් තම මිතුරන්හට සරලබව හා ශ්‍රේෂ්ඨත්වය ඇතුළත් කීකරු බව ලබා දුන්නේය. ඒ සඳහා උසස් වූ ආදර්ශයක් ලෙසට එතුමාණෝ ජීවත් වූහ.

සමාව දීම

'සමාව' යන යහ ගුණය අල්ලාහ්ගේ ගුණාංගයන්ගෙන් එකකි. ඔහුගේ අලංකාරවත් නම් බොහෝමයක් සමාව දෙන සුලු ගුණාංගය සඳහා වූ මනා නිදසුන් ලෙස දිස් වේ. ඔහු සමාව දීමේ දී පොහොසත් වූවකු බව පැහැදිලි කරයි.

සමාව දීම මුස්ලිම්වරයකුගේ උසස් ගුණයකි. ඒ පිළිබඳ තහවුරු කරන අල් කුර්ආන් වැකි අනන්ත ය. එම ගුණය සතු අය ඉස්ලාම් "දේව බිය ඇති උසස් මුස්ලිම්වරයකු" ලෙස ද අල්ලාහ්ගේ ආදරය හා ශුද්ධ වූ තෘප්තිය ලැබූවකු ලෙස ද සලකයි.

"මොවුහු කවරෙක්ද යත් සම්පතේ දීත් දිළිඳු භාවයේ දීත් (එක සේ ම නොවෙනස් ව අල්ලාහ්ගේ මාර්ගය උදෙසා තමන්ගේ ධනය නොමසුරුව) වැය කරන්නා වූ ද (තමන්ගේ) කෝපය පාලනය කර ගන්නා වූ ද මිනිසුන්ට සමාව දෙන්නා වූ ද අය වෙති. යහකම් කරන්නන් අල්ලාහ් බෙහෙවින් ප්‍රිය කරයි." (3 ආල ඉම්රාන් : 134)

"යමකු ඉවසා ක්ෂමා කරන්නේ නම් නියතවශයෙන් එය අධිෂ්ඨාන සහගත කරුණුවලින් ය." (42 : අෂ් ෂූරා 43)

ආයිෂා රළියල්ලාහු අන්හා තුමිය පිළිබඳ පැවැසූ අවස්ථාවේ දී අබූ බක්ර් රළියල්ලාහු අන්හු තුමාගේ සිත දැඩි ලෙස කම්පාවට පත්විය. ඒ නිසා ඔහු ඒ ක්‍රියා හා සම්බන්ධ වූවන්ට, තමන් කරමින් පැමිණි උදව් නවතා දමන බවට දිව්රා පැවසුවේ ය. එවිට අල්ලාහ් පහත පරිදි දැනුම් දෙයි.

"නුඹලා අතුරින් ත්‍යාගශීලී සහ ධනවත් අය, තම ඥාතීන්ටත් දිළිඳු අයටත් අල්ලාහ්ගේ මාර්ගයේ සංක්‍රමණය කළ අයටත් නොදෙන බවට දිවුරීම් නොකරත්වා. ඔවුන් (දෙස් කීම නොසලකා) කමා කළ යුතු ය. තව ද ඉවසිය යුතු ය. අල්ලාහ් නුඹලාට සමාව දිය යුතු යැයි, නුඹලා අපේක්ෂා නොකරන්නෙහි ද? තව ද අල්ලාහ් පරම ක්ෂමාශීලීය. අසමසම කරුණාන්විතය." (24 අන් නූර් :22)

එක් ගැත්තකු තවත් කෙනකුට වැරදි සඳහා සමාව දුන් විට අල්ලාහ් එම ගැත්තාගේ වැරදි සමා කරයි, යන සත්‍ය මෙම අල් කුර්ආන් වැකිය අවධාරණය කරයි. ඒ නිසා ඉස්ලාම් පවසන මෙම ගුණාංග අපි ද අනුගමනය කරමු.

පාඩමේ ඇතුළත් වැදගත් අරාබි වචන

❁ الآدَابُ ❁ الأَخْلاقُ ❁ السُّلُوْكُ ❁ الأَخْلاقِيَّاتُ ❁ الجِنَايَاتُ ❁ المُنَاكَحَاتُ ❁
❁ المُعَامَلاَتُ ❁ العِبَادَاتُ ❁ العَقَائِدُ ❁ أَحْسَنُ الخُلُقِ ❁ الغَفُوْرُ ❁ الغَفَّارُ
❁ التَّوَّابُ ❁ العَفُوُّ ❁ الصَّبْرُ ❁ التَّوَاضُعُ ❁ الشُّجَاعَةُ

අභ්‍යාසය

1. යහ ගුණාංග ගැන ඉස්ලාමීය අදහස් ඉදිරිපත් කර එහි වැදගත් කම පැහැදිලි කරන්න.
2. නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණන්ගෙන් දක්නට තිබූ කීකරු බව යන යහ ගුණාංගය ගෙනහැර දක්වන සිද්ධියක් ඉදිරිපත් කරන්න ?
3. "සමාව දීමේ උසස් ගුණය ප්‍රගුණ කළ අයකු ලෙස නබි නායක තුමාණෝ පසුවූහ" මෙම ප්‍රකාශය සාක්ෂි සහිත ව පැහැදිලි කරන්න.
4. 'අප අන් අයට සමාව දෙන විට අල්ලාහ් ද අපහට සමාව දෙයි.' මේ පිළිබඳ අල් කුර්ආන් වැකියක් ඉදිරිපත් කරන්න.
5. කෙටි සටහන් ලියන්න
   (අ) ඉවසීම
   (ආ) ධෛර්ය සම්පන්න බව
   (ඉ) සමාව දීම